සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 07 ශ්‍රේණිය | ඉතිහාසය | කාලය : පැය 2 |
|---|---|---|

(01) අතීතයේ ලංකාවේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් නොවන්නේ කුමක්ද?

(1) ගොවිතැන (2) වෙළදාම (3) සත්ත්ව පාලනය (4) දඩයම

(02) පැරණි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ග ක්ෂේත්‍ර ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

(03) පැරණි ලක්දිව ජනයා මුහුණදුන් ප්‍රධාන අභියෝගය කුමක්ද?

(1) ආහාර නිෂ්පාදනය (2) නියඟය

(3) සතුරු ආක්‍රමණ (4) ස්වාභාවික විපත්

(04) හේන් ගොවියන් වගා නොකළ වර්ගය කුමක්ද?

(1) ධාන්‍ය (2) එළවළු (3) අල වර්ග (4) වී

(05) උම්මග්ග ජාතකයේ හේන් හඳුන්වා ඇත්තේ,

(1) සේන් (2) හේන (3) පිටබිම් (4) ගොඩබිම්

(06) කාවන්තිස්ස රාජ්‍ය සමයේ හේන් වගාකළ සොහොයුරන් පස්දෙනෙකු ගැන තොරතුරු ඇති මූලාශ්‍රය කුමක්ද?

(1) සෙල්ලිපි (2) මහාවංශය
(3) උම්මග්ග ජාතකය (4) කාවන්තිස්ස චරිතාපදානය

(07) මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වී ඇති රජු කව්ද?

(1) දුටුගැමුණු රජු (2) දෙවන සේන රජු (3) මහසෙන් රජු (4) ධාතුසේන රජු

(08) මඩ ගොවිතැනේ දී භාවිතා නොකළ වචනය කුමක්ද?,

(1) ගොයම් කොළය (2) කමත (3) ගොයම් මැඩීම (4) උදක

(09) පස්ගෝ රසවලට අඩංගු නොවන්නේ කුමක්ද?

(1) දී කිරි (2) කිරිගෙරි

(3) මෝරු (4) ගිතෙල්

(10) ලංකාවේ සත්ත්ව පාලනයට යොදා නොගත් සත්ත්වයා කවුද?

(1) ගවයා (2) කුකුළා
(3) රිලවා (4) ඌරා

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති **A** තීරුව හා **B** තීරුව ගැලපෙන ලෙස යා කරන්න.

| **A** තීරුව | **B** තීරුව |
|---|---|
| (11) කමත | විදේශ වෙළඳාම |
| (12) මඩ ගොවිතැන | ගොයම් පාගන ස්ථානය |
| (13) තවලම | රන් ආභරණ |
| (14) ලෝහ කර්මාන්තය | සතුන් පිට බඩුගෙන යාම |
| (15) ඇත්දල පිටරට යැවීම | වී වගාව |

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි ප්‍රකාශයක් නම් හරි (✓ )ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

(16) වී පරිහරණය තෙක් රැස් කළ ස්ථානය වී බිස්ස වේ. (.................)

(17) වී ගොවිතැන සුරැකීමට දඩුවැට භාවිතා කර ඇත. (.................)

(18) අලුතින් ගිනි තබා සකස් කළ භූමිය හේන නම් වේ. (.................)

(19) ලියදි සකසා ඇත්තේ ජලය අවශ්‍ය පරිදි වී ගොවිතැනට යෙදවීමටයි. (.................)

(20) සී සෑම තුළින් සිදු කළේ වී ගොවිතැන ආරක්ෂා කිරීමයි. (.................)

- **ප්‍රශ්න අංක 21 25 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(21) පැල් රැකීම සිදු කළේ (මඩ ගොවිතැන / හේන් ගොවිතැන) තුළයි.

(22) ඇල් හාල් අස්වැන්න ඉහල ගිය නිසා (දුටුගැමුණු රජුට / සාලිය කුමරුට) ඒ නම යොදා ඇත.

(23) අතීතයේ ගොවියෝ කන්න (තුනක් / දෙකක්) වගා කර ඇත.

(24) පිටරටවල් සමග කරන වෙළඳාම (විදේශ වෙළඳාම / අභ්‍යන්තර වෙළඳාම) ලෙස හඳුන්වයි.

(25) වෙළඳ සංවිධාන (පුග / නිගම ) ලෙස හඳුන්වා ඇත.

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා ප්‍රශ්නවල අදාල නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

(26) හේන් ගොවිතැන .................................................... ගොවිතැන ලෙස හඳුන්වා ඇත.

(27) ගොයම් කැපීමට භාවිතා කර ඇත්තේ .................................................... වේ.

(28) වර්ෂා කාලය එළඹෙනවිට හේන් ගොවියෝ .................................................... බෝග වගා කළහ.

(29) තෝනිගල ශිලා ලිපියේ අකලහස ලෙස දක්වා ඇත්තේ ................................................... කන්නයයි.

(30) මින්නේරි දෙවියන් ලෙසට පත් වී ඇත්තේ ................................................... රජු ය.

## II කොටස

* පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

**A** රූපය



.................................

**B** රූපය



.................................

**C** රූපය



.................................

**D** රූපය



.................................

**E** රූපය



.................................

(02) **(i)** කෘෂි කර්මාන්තය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

**(ii)** ගොවිතැන බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

**(iii)** සත්ත්ව පාලනයේ දී ඇති කළ සතුන් නම් කර එම සතුන්ගෙන් ලබා ගත් ප්‍රයෝජන දෙකක් ලියන්න.

(03) **(i)** හේන් ගොවිතැන කළ ගොවියෝ වගාව ආරක්ෂා කිරීමට භාවිතා කළ ක්‍රම දෙකක් ලියන්න.

**(ii)** හේන්වල වගා කළ ධාන්‍ය වර්ග දෙකක් ලියන්න.

**(iii)** හේනක් සකස් කරන ආකාරය ලියන්න.

(04) **(i)** ගිනියාතිකාව සහ නවදැලිහේන යනු කුමක්ද?

**(ii)** අද වනවිට අප රටේ වී වගා කරන කන්න දෙක ලියන්න.

**(iii)** ගවයා වී වගාවේ දී උදව් වන ආකාරය පැහැදිලි කරන්න.

(05) **(i)** ලංකාවේ පැරණි ලෝහ කර්මාන්ත දෙකක් ලියන්න.

**(ii)** යකඩ වැඩ කළ සහ තඹ කර්මාන්තය කළ අය හඳුන්වන නම් ලියන්න.

**(iii)** වී වගාව ආරක්ෂා කර ගැනීමට ගොවියා අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් පෙන්වා දෙන්න.

(06) **(i)** වෙළඳාම බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.

**(ii)** අතීතයේ ලංකාවේ දියුණු වෙළඳ නගර දෙකක් ලියන්න.

**(iii)** නිගම, පූග හා වලඤ්ජියාර් යන වචනවල තේරුම ලියන්න.